# 13. සුවය දෙන සමිඳාණෝ

පේදුරු සහ ජොහන් ඔවුන්ගේ සේවය ආරම්භයේ දී ම කොර ව සිටි මිනිසකු සුවපත් කිරීමේ සිද්ධිය ගැන මෙහි දී උගනිමු. දෙවියන් වහන්සේ සුවය දෙන සමිඳාණන් බව මින් වැඩිදුරටත් අවබෝධ කර ගැනීම අපේක්ෂිත ය.

## ක්‍රියා 3 : 1 - 10

අප දැන් ඉගෙන ගන්නට යන්නේ ක්‍රියා පොතේ 3 : 1 - 10 කොටසේ ඇති පේදුරු හා ජොහන්තුමා කළ පළමු සුව කිරීම යි. ඔවුහු ජෙරුසලම් දේව මාලිගාවේ යාච්ඤා කරන වේලාව වූ සවස 3.00 ට යාච්ඤා කිරීම සඳහා පැමිණියහ.

සුදර්ශන නම් ලත් දොරටුව ආසන්නයේ රෝගීන් හා යාචකයන් රැඳී සිටියහ. ඔවුහු එතැනින් යන - එන බැතිමතුන්ගෙන් නිරතුරුව ම සිඟමන් ඉල්ලූහ. මේ සිද්ධියේ සඳහන් වන කොර වූ පුද්ගලයා උපන් දා පටන් ඒ ආබාධයෙන් පෙළෙමින් සිටියේ ය.

පේදුරු හා ජොහන් දේව මාලිගාවට පැමිණෙන විට දී මොහු සිඟමන් ඉල්ලුවේ ය.

පේදුරු සහ ජොහන් "අප දෙස බලන්න"යැයි ඔහුට පැවසීය. ඔහු ඔවුන් දෙස බැලූ කල පේදුරුතුමා මෙසේ පැවසී ය.

"රන්වත් රිදීවත් මට නැත. එහෙත් මට ඇති දේ ඔබට දෙමි. නාසරෙත්හි ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් ඇවිදින්න."
(ක්‍රියා 3 : 6)



අනිත් සියලුදෙනා ම කොර වූ පුද්ගලයාට මුදල් දෙන්නට ඇත. එය ලබා ටික දිනකින් අවසන් වේ. අප අනිත් අයට උදව් කිරීම අවශ්‍ය ය. එහෙත් අප නිතර ම දිය යුත්තේ දෙවියන් වහන්සේ අපට දෙන ඉස්තරම් දේ ය. ශුද්ධාත්මයාණන්ගේ බලයෙන් දැන් පේදුරු කොර වූ පුද්ගලයාගේ ජීවිතයට අවශ්‍ය ම දේ දෙන්නට සූදානම් ය. ඒ දෙවියන් වහන්සේ ලබා දෙන සුවයයි. පේදුරුතුමා මේ අවස්ථාවේ දී ජේසුස් වහන්සේගේ නාමයෙන් මෙසේ අණ කරයි.

**"නාසරෙත්හි ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් ඇවිදින්න."** මේ අවස්ථාවේ දී පේදුරු ඔහුගේ අත දිගුකොට ඔහු නැගිටවී ය. ඔහු පවසන්නේ වචන කීපයක් පමණක් නොවේ. ඒ තුළ ශුද්ධාත්මයාණන්ගේ බලය ගැබ් වී තිබේ ප්‍රතිඵලය නම් කොර වූ පුද්ගලයාගේ පාද සහ වළලුකර ශක්තිමත් වී ඇවිදීමට හැකියාව ලැබීම යි, ඔහුට සුවය ලැබීම යි.

## කොර වූ තැනැත්තාගේ ප්‍රතිචාරය

ඔහු සුවය ලැබූ විට, දක්වන ප්‍රතිචාරය සලකා බලන්න. ඔහු "ඇවිදිමින් උඩ පනිමින්", දෙවියන් වහන්සේට ප්‍රශංසා කළේ ය. එතැනින් නතර නො වුණු හෙතෙම, ජීවිතයේ කිසි දිනක නො ගිය දේව මාලිගාව ඇතුළට ද ගොස් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළේ ය.

මෙම සුවකිරීමේ සිද්ධියෙන් අපට ඉගෙන ගත හැකි දේ කුමක් ද?

- ජේසුස් වහන්සේ අපගේ පාපවලට කමාවත් රෝගවලට සුවයත් ජීවිතයට ප්‍රීතියත් සහනයත් ලබා දෙන සේක.
- ලෝකයේ මිල මුදලට අපට සුවය දිය නො හැකි ය.
- උන් වහන්සේ පටන්ගත් සේවය ශුද්ධාත්මයාණන් වහන්සේ ඉදිරියට ගෙන යන සේක.
- උන් වහන්සේ සිය ශ්‍රාවකයින් තුළින් සුභාරංචියේ සේවය ඉටු කරන සේක.
- ප්‍රේරිතයන් කළ සියලු සුවකිරීම්වලට බලය දෙනු ලැබුයේ ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ය.
- ශුද්ධාත්මයාණන් වහන්සේ අද දවසේත් අන් අය සුවපත් කිරීම සඳහා අප යොදවන සේක.
- එසේ ම අපට අවශ්‍ය මානසික සුවය ද ශාරීරික සුවය ද ආත්මික සුවය ද උන් වහන්සේ ලබා දෙන සේක.

මේ ගැනත් සිතන්න. . . . . .

සුවය ලැබීමට හා දීමට අප කළ යුත්තේ ඇදහිල්ලෙන් හා ප්‍රේමයෙන් යාච්ඤාව ඔප්පු කිරීම යි.

එවිට ශුද්ධාත්මයාණන් වහන්සේ අපට පිළිතුරු දෙන සේක.

පේදුරු හා ජොහාන්ට ඔවුන්ගේ ශක්තියක් ගැන නොව ජේසුස් වහන්සේගේ නාමය කෙරේ ඇති විශ්වාසය බලවත් විය.

අප ද සැම විට ම මේ ලෝකයේ මිල මුදලින් ලබා ගැනීමට උත්සාහ කරන සුවයට වඩා ශුද්ධාත්ම බලයෙන් ලබන සුවය ගැන බලවත් විශ්වාසයක් ඇතිව සිටිය යුතු ය.

මෙසේ අපිත් ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වයට අපගේ ජීවිතයෙන් ඉඩ දෙමු.

## ක්‍රියාකාරකම

1. සුදර්ශන දොරටුව අසල සිටි කොර වූ මිනිසා සුවපත් කිරීම තුළින් ඔබ උගත් කරුණු 05 ක් ලියන්න.

2. ඔබේ යහළුවන් වෙනුවෙන් යාච්ඤා කළ යුතු කරුණු පහක් ලියන්න.